## විමර්ශි 38

# මයික් පෝස්ටර් මූලාශ්‍රයක් නොවූ මාධ්‍ය

ශ්‍රී ලංකාවේ ජනතාවට බලපාන මානුෂවාදී ගැටළු ගැන කතා කරන විට අද ලෝකයේම අවධානයට ලක් වී ඇත්තේ යුද්ධය නිසා අවතැන් වී සිටින ජනතාවය. ලක්ෂ තුනක පමණ ජනතාවකට කෙටි කලක් තුළ යුද්ධය නිසා අවතැන්ව වව්නියාවේ අවතැන් කඳවුරුගත වන්නට සිදු විය. ඔවුන් මුහුණ දෙන මානුෂවාදී ගැටළු ගැන සමහර සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් අතර හුදකලා කතා බහ ඇති වුවත් එම ජනතාව ගැන මේ රටේ මාධ්‍ය හරහා තොරතුරු අනාවරණය වන්නේ නැති තරම්ය. මාධ්‍ය විසින් තොරතුරු සොයා කරන වාර්තා කිරීමක් දකින්නට නැත. ශ්‍රී ලංකාවේ මාධ්‍යවලින් වාර්තා වන්නේ අවතැන් ජනතාව සම්බන්ධයෙන් සපයන පහසුකම්, ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක ව්‍යාපෘති, නැවත පදිංචි කිරීම් ආදිය සම්බන්ධයෙන් රජය ලබා දෙන පුවත් පමණය. යම් තරමකින් හෝ තොරතුරක් සමාජගත වන්නේ අවතැන් ජනතාවගේ ගැටළු විසඳීම සඳහා ආධාර කරන ජාත්‍යන්තර නියෝජිතයකු මෙරට සංචාරය කිරීමෙන් පසු කරන ප්‍රකාශයක් හරහාය. එවැනි අවස්ථාවලදී වුව ගැටළු ගැන කරන ප්‍රකාශය එලෙසින් වාර්තා කරන්නේ මාධ්‍ය කිහිපයක් පමණි. විශේෂයෙන් සිංහල මාධ්‍ය එවැනි සිදුවීමක මුල් පුවත වාර්තා නොකිරීම පසුගිය වසර පුරාම දක්නට ලැබුණු විශේෂත්වයකි. ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්ද යුද්ධයට පෙර ක්‍රියාකරන ලද්දේ එලෙසින්ම වුවත් යුද්ධයට පසු සමහර පුවත්පත් සමහර මුල් පුවත් වාර්තා කරන්නට උත්සාහ ගනී. සමබර වාර්තාකරණයකට ගන්නා උත්සාහයන් කිහිපයක් එහිදී දැකිය හැකි විය. අවතැන් කඳවුරුවල ගෙවන්නට සිදු වී ඇති මිනිස්කමට නොගැලපෙන ජීවිත ගැන වාර්තා කරන්නට මූලාශ්‍ර සොයන දෙමළ මාධ්‍ය පුවත්පත් එවැනි ප්‍රකාශයක් සිදු වූ විට එය උපරිම මට්ටමින් වාර්තා කිරීම ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ කැපී පෙනෙනම වෙනස්කම විය. භාෂා තුනටම අයත් රජයේ මාධ්‍ය හා රජය හා සමගාමී මතයක පිහිටා ක්‍රියාකරන මාධ්‍ය කිසිසේත් අවතැන් ජනයාගේ අයිතීන් ගැන වාර්තා කිරීමක් නොකරණ අතර ඒවා ගැන කතා කරන පුද්ගලයන්ට හා සංවිධානවලට එරෙහිව දැඩි ප්‍රහාරාත්මක පුවත් නිර්මාණය කරමින් වාර්තා කරයි. අවතැන් ජනතාවගේ තත්ත්වය ගැන අසතුට පළ වන ප්‍රකාශයක් කරන පුද්ගලයන් හා සංවිධාවලට එරෙහිව මෙන්ම කරුණු පැහැදිලි කිරීම සඳහා රජයේ බලධාරීන් කරන ප්‍රකාශවලට ප්‍රමුඛත්වය දෙමින් වාර්තා කිරීම පසුගිය වසර පුරාම මාධ්‍ය තුළින් දකින්නට ලැබිණ. මුල් පුවත පළ නොකළත් මුල් ප්‍රකාශයේ අඩංගු කරුණු තේරුම් ගත හැකි ආකාරයට පිළිතුරු පුවත් පළ කිරීමට සමහර මාධ්‍ය උත්සාහ කර තිබිණ. සමහර මාධ්‍ය එවැනි උත්සාහයක්වත් දරන්නේ නැත. ඔවුන්ගේ පාඨකයන්ට දැන ගන්නට ලැබෙන්නේ අදාල පුද්ගලයා ශ්‍රී ලංකාවට අපකීර්තියක් වන ආකාරයට අවතැන් ජනයා සම්බන්ධයෙන් වැරැදි තොරතුරු ඉදිරිපත් කර ඇති බවක් පමණි.

ශ්‍රී ලංකාවට පැමිණ මැණික්ෆාම් අවතැන් කඳවුරුවලට ගොස් එම ජනතාව මුණ ගැසුණු බ්‍රිතාන්‍ය රජයේ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය මයික් පෝස්ටර් මහතා එම ජනතාව සම්බන්ධයෙන් සිය අදහස් පළ කළේ මෙවැනි තත්ත්වයක් යටතේය. ඔක්තෝබර් මස 6 වැනිදා ශ්‍රී ලංකාවට පැමිණ අවතැන් කඳවුරු නිරීක්ෂණ චාරිකාවකට සහභාගී වූ පෝස්ටර් මහතා දැක්වූ අදහස් ආකාර කිහිපයකට වාර්තා වී ඇති ආකාරය ඔක්තෝබර් මස 5 සිට 11 දක්වා සතිය තුළ මාධ්‍ය නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබිණ. අවතැන් ජනයා සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියා කර ඇති ආකාරය ගැන ඔහු සෑහීමට පත්වී ඇති ආකාරය මූලික කර ගෙන ඇති නමුත් සමහර කටයුතු සම්බන්ධයෙන් සෑහීමට පත් වී නැති බව ප්‍රකාශ කෙරෙන වාර්තාකරණය එක් ආකාරයකි. එක් දිනපතා සිංහල පුවත්පතක් (ලංකාදීප) ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. ''අවතැන් ජනයා වැසි සමයට පෙර පදිංචි කරවන්න බ්‍රිතාන්‍ය ආධාර'' යන සිරස්තලය යටතේ පළ කරන වාර්තාවෙන් අවතැන් ජනයා දීර්ඝකාලීනව කඳවුරුවල රඳවා තබා ගැනීමට ආධාර නොකරණ බව මෙන්ම සියයට 70ක් පමණ ඥාතීන් සමඟ යෑමට කැමැත්ත පළ කළ බව වැනි ගැටළුද අනාවරණය කරයි. අමාත්‍යවරයා වැඩ පිළිවෙළ ගැන අසතුටට පත්වී ඇති ආකාරය පැහැදිලි වන ආකාරයට ඔහු කළ ප්‍රකාශය වාර්තා කිරීම දෙවැනි ආකාරයයි. එයින් ඍජුවම ප්‍රකාශ වන්නේ මෙතෙක් අවතැන් වූවන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන සතුටු විය නොහැකි බවයි. සිංහල පුවත්පත් වාර්තා දෙකක් (රාවය, ඉරුදින) ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. මෙහිදී තවත් පවුම් මිලියන 4.8ක ආධාර කිරීමට බ්‍රිතාන්‍ය සූදානම් නමුත් සැලකිය යුතු කොටසක් ගම්බිම්වල පදිංචි කළ පසු ඒවා ලබා දෙන බව එක් වාර්තාවකින්

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

පැහැදිලි කරයි. රජයේ මාධ්‍ය දෙමළ පුවත්පත හැර ඉතිරි පුවත්පත් තුන මේ සම්බන්ධයෙන් වඩා කැපී පෙනෙන වාර්තාකරණයක් කර ඇත. දෙමළ පුවත්පත්වල අමාත්‍යවරයාගේ ප්‍රකාශ අදාල කරගත් වාර්තා 15ක් පමණ (ප්‍රධාන සිරස්තල 3ක් ද ඇතුළුව) පළ වී ඇති අතර ඒවායින් වැඩි ප්‍රමාණය අයත් වන්නේ අවතැන් ජනයාගේ තත්ත්වය සම්බන්ධයෙන් අසතුට පළ කිරීම වාර්තා කිරීමටය. එක් වාර්තාවකට (සුඩර් ඔලි) අමාත්‍යවරයා මෙරටේදී කළ ප්‍රකාශවලට අමතරව ටයිම්ස් වෙබ් අඩවියේ පළ වූ වාර්තාවක්ද මූලාශ්‍ර කර ගෙන ඇත. අවතැන් වූවන් වෙනුවෙන් බ්‍රිතාන්‍ය මෙතෙක් ලබා දී ඇති ආධාර නිසියාකාරව භාවිතා කර නොමැති බවද ඒ තොරතුරුවලින් අනාවරණය වෙයි. කෙසේ නමුත් මෙම සිදුවීම වාර්තා කිරීමේදී වඩා ප්‍රමුඛතාවක් දී ඇත්තේ දෙමළ මාධ්‍ය පුවත්පත් පමණි.

ඔහුගේ ප්‍රකාශ පිළිගත නොහැකි ඒවා බවට රජයේ බලධාරීන් කළ ප්‍රකාශ වාර්තාකරණය තවත් එක් ආකාරයකි. මෙහිදී බ්‍රිතාන්‍ය අමාත්‍යවරයා කළ සමහර ප්‍රකාශ සම්බන්ධයෙන් මවිත වන බව ප්‍රකාශ කළ ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශ ලේකම් රජීව විජේසිංහ හා එම අමාත්‍ය මහින්ද සමරසිංහ දැක්වූ අදහස් දක්නට ලැබිණ. සිංහල පුවත්පත් වාර්තා කිහිපයක් මෙන්ම දෙමළ පුවත්පත් දෙකකද එම වාර්තා දකින්නට ලැබිණ. එක් දෙමළ පුවත්පතක් අමාත්‍යවරයා ප්‍රකාශය වාර්තා කර තිබුණේ ප්‍රධාන සිරස්තලයක් ලෙසය. බ්‍රිතාන්‍ය ආධාර නැවත පදිංචි කිරීමට අනවශ්‍ය බව මහින්ද සමරසිංහ අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇති බව එම වාර්තාවෙන් අනාවරණය වෙයි. මේ කාලය තුළ පළ වී ඇති එකම කතුවැකියෙන්ද (දිවයින) ප්‍රශ්න කර ඇත්තේ ආධාර සීමා කිරීම ගැනය. බටහිර රටවල් එල්ටීටීඊ හිතවාදීව ක්‍රියාකරන බව එමගින් චෝදනා කරයි. මීට අමතරව බ්‍රිතාන්‍ය අමාත්‍යවරයා රෝහිත බෝගොල්ලාගම අමාත්‍යවරයා සමඟ කළ සාකච්ඡාවේදී අවතැන් ජනයා සම්බන්ධයෙන් ඉටු කර ඇති කාර්යභාරය ගැන සතුට පළ කළ බව ප්‍රකාශ කරන වාර්තා කිහිපයක්ද දකින්නට ලැබිණ. රජයේ මාධ්‍ය හා රජයේ මතයට අනුව කටයුතු කරන මාධ්‍ය මේ පුවත විශේෂයෙන් වාර්තා කර ඇත. මේ කාලය තුළ සිදුවීමට අදාලව සිංහල පුවත්පත්වල පළ වී තිබුණේ පුවත් 9ක් පමණි. ඉංග්‍රීසි පුවත්පත්වල ඉතාම අඩු වාර්තාකරණයක් දකින්නට ලැබුණු අතර එය ගණනින් 4කි. ඒවා අයත් වූයේ පුවත්පත් දෙකකටය. එයින් පුවත් දෙකකින් (ඩේලි මිරර්, අයිලන්ඩ්) අනාවරණය වන්නේ, ඉහත කී ආකාරයට පෝස්ටර් මහතා අසතුටට පත් වී ඇති ආකාරයයි. ඉතිරි පුවත් දෙකෙන් රෝහිත බෝගල්ලාගම අමාත්‍යවරයා සමඟ කළ සාකච්ඡාවේ ප්‍රතිඵල වාර්තා කරයි.

විශේෂයෙන් දෙමළ පුවත්පත් වාර්තා හා අනෙකුත් මාධ්‍ය වාර්තා කිහිපයක තොරතුරු එකතු කොට බැලූ විට පෝස්ටර් මහතා අවතැන් වූවන්ගේ ගැටළු සම්බන්ධයෙන් කරුණු ගණනාවක් මතු කොට ඇති බව පෙනේ. නැවත පදිංචි කිරීමේදී පෙන්වා ඇත්තේ අඩු ප්‍රගතියක් බව, බ්‍රිතාන්‍ය ආධාර නිවැරැදිව භාවිතා කර නොමැති බව, අවතැන් ජනයා කඳවුරකින් කඳවුරකට මාරු කිරීම නැවත පදිංචි කිරීමක් නොවන බව, මෝසම් වැසිවලට පෙර අවතැන් ජනයා නැවත පදිංචි කළ යුතු බව, අවතැන් 2,60000ක් ගැන බ්‍රිතාන්‍ය ඉතාම සංවේදීව සිටින බව, කඳවුරු නඩත්තු කිරීමට දෛනික ආධාර දීමට අන්තර්ජාතික ප්‍රජාව තව දුරටත් සූදානම් නැති බව, පවුම් ඩොලර් මිලියන 4.8ක් තව දුරටත් ආධාර ලබා දීමට බ්‍රිතාන්‍ය සූදානම් නමුත් කඳවුරුවල අලුත් ගොඩනැගිලි ඉදි කිරීමට හෝ කඳවුරු පවත්වා ගෙන යෑමට ඒවා නොදෙනෙ බව, සියයට 70ක් පමණ ජනතාව ඥාතීන් සමඟ ජීවත් වීමට කැමැති බව අනාවරණය වූ බව වැනි කරුණු රැසක් මයික් පෝස්ටර් මහතා ප්‍රකාශ කර ඇත. එමෙන්ම ඔහු එසේ ප්‍රකාශ කිරීමට බ්‍රිතාන්‍යයට කොන්දක් තිබීම ගැන ටයිම්ස් වෙබ් අඩවිය ප්‍රසාදය පළ කර ඇති ආකාරය දෙමළ මාධ්‍ය වාර්තාවකින් අනාවරණය වී ඇත. කෙසේ වෙතත් මේ තොරතුරු සියල්ල එක් මාධ්‍යයක් පරිහරණය කරන කෙනෙකුට දැන ගන්නට ලැබෙන්නේ නැත. සමහර මාධ්‍ය පරිහරණය කරන කෙනෙකුට අවතැන් ජනයාගේ ගැටළු ගැන කිසිවක්ම දැන ගන්නට නොලැබෙන අතර ඔවුන්ට සිතන්නට සිදු වන්නේ ඉතාම යහපත් අන්දමින් ඔවුන්ගේ ගැටළු විසඳී ඇති බව පමණි. මේ රටේ මාධ්‍යයට තමන් විසින් තොරතුරු සොයා වාර්තා කරන්නට නිදහසක් නොලැබී ඇති බව සත්‍ය නමුත් ලැබෙන අවස්ථාද (මූලාශ්‍ර) මෙලෙස මග හැර යෑමෙන් අප තේරුම් ගත යුත්තේ කුමක්ද? මානුෂවාදී පුවත් වාර්තාකරණයේදී මේ වෙනසට හේතුව ඔවුන් සිංහල ජනතාව නොවීමද?

**සීතා රංජනී**

**seetha@ranjanee**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com